# ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

## පාසල් යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම




දුරකථන - 011-2676650
ෆැක්ස් - 011-2676646
වෙබ් අඩවිය - www.slic.gov.lk
විද්‍යුත් තැපැල - info@slic.gov.lk
Youtube නාලිකා - Sri Lanka Inventors / Sri Lanka Inventors Commission

**අධ්‍යක්ෂ**
**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම**
**5 වන මහල,**
**"මෙහෙවර පියෙස" ගොඩනැගිල්ල,**
**කොළඹ 05.**

# <u>පාසල් නව නිපැයුම් සමාජ පිහිටුවීම</u>

## <u>අරමුණු</u>

I. පාසල් සිසුන් අතර නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය කිරීම හා ඊට ධෛර්යය දීම.

II. ස්වකීය නව නිර්මාණ බාධාවකින් තොරව එළි දැක්වීමට පාසලේ දී අවස්ථාව හා පහසුකම් සලසා දීම.

III. පාසල් සිසුන්ගේ විද්‍යා හා තාක්ෂණය පිලිබඳ අවබෝධයෙහි භාවිතය ප්‍රගුණ කරවීම

IV. පාසල් නව නිපැයුම්කරුවන් නව නිපැයුම්කරණයට හා ප්‍රදර්ශන වලට සහභාගී කරවීම.

V. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හා පොදු මහජන බහුතරය අතර අන්‍යොන්‍ය සබඳතාව ස්ථාපිත කිරීම.

VI. පාසල් පද්ධතියෙන් බිහිවන නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර ලබාගැනීම, පර්යේෂණ අවස්ථාවන්ට යොමු කිරීම හා මූලාදර්ශයන් දක්වා වැඩිදියුණු කිරීමට ඉඩ ප්‍රස්ථා සාපේක්ෂිත කුසලතා පදනම මත ලබාදීම.

VII. විද්‍යාත්මක සිද්ධාන්ත ප්‍රායෝගික භාවිතය පමණක් නොව වාණිජමය අගයෙන් යුත් නව නිපැයුම් බිහිකිරීමේ වැදගත්කම හඳුන්වාදීම.

## <u>විධායක කමිටුව</u>

1. ගරු අනුශාසක (තනතුරු දෙකකි)
2. සභාපති
3. උප සභාපති
4. භාණ්ඩාගාරික
5. ලේකම්
6. උප ලේකම්
7. සංස්කාරක
8. කාරක සභිකයින් (උපරිමය සත් දෙනෙකි)

**1. ගරු අනුශාසක**

i. පාසලේ විදුහල්පති

ii. නව නිපැයුම් සමාජයේ කාර්‍යයන් ගැන උනන්දුවකින් හා කැපවීමකින් කටයුතු කරන ගරු කටයුතු පුද්ගලයෙකු ද අනුශාසක ලෙසින් පත් කර ගත හැකිය. මේ සඳහා විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ උසස් දැනුමක් ඇති පාසලේ හිටපු ගුරුවරයෙකු හෝ ආදි සිසුවකු හෝ වඩාත් සුදුසුය.

**2. සභාපති**

**3. උප සභාපති**

**4. භාණ්ඩාගාරික**

විදුහල්පති විසින් නාම යෝජනා කරනු ලබන, පාසලේ මෙම විෂය සම්බන්ධව උනන්දුවක් දක්වන, එසේම කැපවීමකින් වැඩ කළ හැකි ආචාර්යවරුන් තිදෙනෙකු තෝරාගෙන ඉන් එක් අයෙකු සභාපති වශයෙන් ද, එවැනිම තවත් ආචාර්යවරයෙකු හෝ ආචාර්යවරියකු උප සභාපති වශයෙන්ද එවැනිම උනන්දුවකින් කටයුතු කරන ආචාර්යවරයෙකු හෝ ආචාර්යවරියකු භාණ්ඩාගාරික වශයෙන් ද පත් කර ගත යුතුය.

**5. ලේකම්**

**6. උප ලේකම්**

**7. සංස්කාරක**

**8. කාරක සභිකයන්**

මෙම විෂයයට උනන්දුවක් දක්වන්නාවූ එමෙන්ම කාර්යශූර ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් හෝ ශිෂ්‍යාවන් තිදෙනෙකු ලේකම්, උප ලේකම් හා සංස්කාරක ලෙස විදුහල්පතිගේ අනුමැතිය ඇතිව යොවුන් නව නිපැයුම් සමාජය මඟින් පත්කර ගත හැකිය. **කාරක සභිකයන් ද පාසල් සිසුන් අතුරින්ම තෝරාගත යුතුය.**